# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016

### 2022 මාර්තු/අප්‍රේල්
### සමාජීයවිද්‍යා පීඨය
### පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC E 1025
### පුස්තකාල, ඒවායේ සේවා, එකතු සංවර්ධනය හා කළමනාකරණය

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**
**ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි.** **කාලය : පැය 03 යි.**

---

1. මහජන පුස්තකාලයක එක් කාර්යයක් වන්නේ "කුඩා කල සිටම දරුවන් කියවීමට යොමු කරලීමයි." මහජන පුස්තකාලයක් මගින් මෙම අරමුණ සාර්ථක කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

2. ජාතියේ මතකය ආරක්ෂා කිරීම ජාතික පුස්තකාලයක මූලික වගකීමකි. සාකච්ඡා කරන්න. (ලකුණු 20)

3. සාර්ථක පුස්තකාල ගොඩනැගිල්ලක් යනු පුස්තකාලයාධිපතිවරයා හා ගෘහ නිර්මාණ ශිල්පියා අතර ඇතිවන සමතුලිතබවේ ප්‍රතිඵලයකි. විමසන්න. (ලකුණු 20)

4. පුස්තකාලයක තාක්ෂණික සේවා අංශයක සාර්ථකත්වය උදෙසා එකතු සංවර්ධන ප්‍රතිපත්තියකින් ලැබෙන අනුබලය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

5. ග්‍රන්ථ සංසරණය යනු කුමක්දැයි නිර්වචනය කර මධ්‍යම ප්‍රමාණයේ මහජන පුස්තකාලයක් සඳහා ඔබ නිර්දේශ කරන ග්‍රන්ථ සංසරණ ක්‍රමයක් පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

6. කොවිඩ් වසංගත කාලය තුළ මෙරට ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තය මුහුණ දී තිබෙන අභියෝග හා ඒවාට දැක්විය හැකි ප්‍රතිචාර පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

7. පහත සඳහන් මාතෘකා 04 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   i. සාමූහික ප්‍රතිග්‍රහනය
   ii. පරිග්‍රහනය
   iii. ධූමායනය
   iv. පැරණි නාලන්දා විශ්වවිද්‍යාල පුස්තකාලය
   v. අතථ්‍ය පුස්තකාල

   (ලකුණු 5x4)

*********************************